කොවිඩ් 19 සති පාසල -9 වන ශ්‍රේණිය -පෙබරවාරි පළමු වන සතිය

**<u>ප්‍රතිශත (%) - 2</u>**

## <u>වට්ටම් (discount)</u>




වෙළඳපළ ආකර්ෂණීය ලෙස පවත්වා ගැනීමට ලකුණු කල මිලට ලබා දෙන ප්‍රතිශතමය සහනය වට්ටම ලෙස හැඳින්වේ.මෙහිදී පාරිභෝගිකයාට සෘජු සහන ලැබෙන අකර වෙළෙන්දාට දිගු කාලීන වාසි ලැබේ.

උදා: ( I )විදුලි පන්දමක මිල රු:750 කි. එය විකිනීමේදී 10%ක වට්ටමක් දෙනු ලැබේ. වට්ටම් මුදල හා විකුණුම් මිල සොයන්න.

වට්ටම් මුදල $= \frac{10}{100} \times 750$
$=$ රු:75

විකුණුම් මිල $= 750 - 75$
$=$ රු:675

( II ) පුටුවක නිෂ්පාදන වියදම රු:2000 කි.නිෂපාදකයා රු: 1000 ක ලාභයක් ලැබෙන ලෙස මිල නියම කරයි විකිණීමේදී එයට 10%ක වට්ටමක් දෙනු ලැබේ.භාණ්ඩයේ විකුණුම් මිල හා නිෂ්පාදකයාට ලැබෙන ලාභය සොයන්න

ලකුණු කල මිල $= 2000 + 1000$
$=$ රු:3000

වට්ටම $= 3000 \times \frac{10}{100}$
$=$ රු: 300

විකුණුම් මිල $= 3000 - 300$
$=$ රු: 2700

ලාභය $= 2700 - 2000$
$=$ රු:700

(III) 8%ක වට්ටමක් සහිතව ශබ්ද කෝෂයක් විකුණනු ලබන්නේ රු:1840කට වේ. ශබ්ද කෝෂය විකිණීමට ලකුණු කල මිල කීයද?

| ලකුණුකල මිළ | විකුණු මිළ |
|---|---|
| 100 | 92 |
| x | 1840 |

$$\frac{100 \times 1840}{92} = \frac{x \times 92}{92}$$

$$100 \times 20 = x$$

ලකුණුකල මිළ $=$ රු:2000

ඉහත උදාහරණ අධ්‍යනය කර ප්‍රතිශත පාඩමේ 4.3 අභ්‍යාසයේ 01-05 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

**<u>කොමිස්</u>**




දේපල,වාහන වැනි ගණුදෙනු වලදී ගණුදෙණු කරුවන් සම්බන්ධ කරන අතරමැදියන් හෙවත් තැරැව්කරුවන් විකිනීම් හෝ මිලදීගැනීම් සඳහා යොදන මුදලින් අයකරන ප්‍රතිශතය කොමිස් මුදල ලෙස හඳුන්වයි.

උදා: ( I ) වාහන විකිනීමට දායක වන සමාගමක් 5% කොමිස් ප්‍රතිශතයක් යටතේ රු:1 500 000 ක වාහන ගණුදෙනුවක් සිදුකරයි.අය කරන කොමිස් මුදල කීයද?

අය කරන කොමිස් මුදල $= 1\ 500\ 000 \times \frac{5}{100}$

$=$ රු:75 000

( II ) දේපළ වෙළදාම් සමාගමක් රු:2 500 000 ඉඩමක් විකුණා දීම සඳහා රු:125000 ක් අය කරයි.අය කරන කොමිස් ප්‍රතිශතය ගණනය කරන්න.

කොමිස් ප්‍රතිශතය $= \frac{125\ 000}{2\ 500\ 000} \times 100\%$

$= 5\%$

( III ) වාහනයක් 3% කොමිස් අයකරන සමගමක් හරහා අලෙවි කළ අයෙකුට ලැබුණ මුදල රු:2 910 000කි ඔහු වාහනය අලෙවි කල මුදල කීයද?

| විකුණු මුදල | ලැබුණු මුදල |
|---|---|
| 100 | 97 |
| x | 2 910 000 |

$$\frac{100 \times 2\ 910\ 000}{97} = \frac{x \times 97}{97}$$

$$100 \times 30\ 000 = x$$

වාහනය අලෙවි කළ මුදල =3 000 000

ඉහත උදාහරණ අධ්‍යනය කර ප්‍රතිශත පාඩමේ 4.3 අභ්‍යාසයේ 06-09 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.